## ශ්‍රී ලංකා ගණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 1645 | මණ්ඩලය සතු මෝටර් රථ 4 ක් සඳහා වාහන ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ජේදය | සමාලෝචිත වර්ෂයට අදාලව විධිමත් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබීම. |

### 1.2.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යය බාහිර පාර්ශවයන් වෙත පැවරීම

මණ්ඩලය පිහිටුවීමේ අරමුණ අනුව එහි නිලධාරීන් සෘජුවම කළ යුතු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්ය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් වෙත පවරාදී ඒ වෙනුවෙන් 2011 සහ 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.2,130,000 ක් හා රු.2,490,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත පදනම මත සේවය කරන නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හැකි බව දක්වා තිබුණි. නමුත්, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු නිලධාරීන් තිදෙනෙකුගේ වැටුප පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසිවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන 2011 අප්‍රේල් සිට මසකට රු.30,000 කින්, රු.9,800 කින් සහ රු.1,100 කින් වැඩි කර තිබුණි. මෙම තත්ත්වය ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණත් ඒ සඳහා විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ රජයේ ප්‍රදාන (ගලපන ලද) හා පුනරාවර්තන වියදම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අයිතමය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ඉකුත් වර්ෂය හා සැසඳීමේදී වාසිදායක (අවාසිදායක) ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| රජයේ ප්‍රදාන (ගලපන ලද) | 43,178,222 | 36,800,894 | 17.32 |
| මුළු පුනරාවර්තන වියදම | 41,914,896 | 35,833,155 | (16.97) |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය පිහිටුවා තිබුණත් අපේක්ෂිත කාර්ය භාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය ප්‍රමාණාත්මක නොවන බව ඉකුත් වර්ෂ කිහිපයක කාර්ය සාධනය සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(අ) 2009 සිට 2012 වර්ෂය දක්වා වන කාර්ය සාධන ප්‍රගතිය පහත පරිදි විය.

| | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| වර්ෂය තුළ ලැබුණු වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 1,443 | 1,716 | 1,250 | 1,391 |
| සමාලෝචනය නිම කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 302 | 213 | 211 | 156 |
| සමාලෝචනය කළ වාර්ෂික වාර්තා ප්‍රමාණය සමාලෝචනය කළ යුතුව තිබූ වාර්ෂික වාර්තා ගණනේ ප්‍රතිශතයක් ලෙස | 21% | 12% | 17% | 11% |
| සමාලෝචන කාර්ය සඳහා සහභාගි වූ තාක්ෂණික කාර්ය මණ්ඩලය | 6 | 6 | 5 | 4 |
| වර්ෂය තුල එක් තාක්ෂණ නිලධාරියෙකු විසින් සමාලෝචනය කළ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණය | 50 | 35.5 | 42 | 39 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2011 හා 2012 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්ය සඳහා බාහිර පුද්ගලයන්ගේ (සමාලෝචකයින්) සහාය ලබාගෙන තිබුණි. එම වර්ෂවල සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණය පිළිවෙලින් 213 ක් හා 302 ක් වී තිබුණි. ඉන් මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් 175 ක හා 216 ක් හෙවත් සියයට 82 ක් හා සියයට 72 ක මූලික සමාලෝචන කටයුතු බාහිර පුද්ගලයින් විසින් සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවූ අවස්ථා 61 ක් හදුනාගෙන තිබූ අතර ඉන් අවස්ථා 59 ක්ම එනම් සියයට 97 ක්ම බාහිර පුද්ගලයින් විසින් මූලික සමාලෝචනයන් සිදු කිරීමේදී හදුනා ගෙන

තිබුණි. මණ්ඩලය විසින් මෙම මූලික සමාලෝචන කටයුතු කිරීම වෙනුවෙන් රු.2,490,000 ක මුදලක් ඔවුන් වෙත ගෙවා තිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශන මණ්ඩලය වෙත ඉදිරිපත් නොකරන ආයතන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මණ්ඩලය වෙත ලැබෙන මුල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම හැර මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ආයතන හඳුනා ගෙන අදාල වාර්තා ගෙන්වා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ii) වාර්ෂික මුල්‍ය ප්‍රකාශන, මණ්ඩලය වෙත ඉදිරිපත් නොකරන ආයතන සම්බන්ධයෙන් දඩ මුදලක් පැනවීම සඳහා පනතේ අවශ්‍ය සංශෝධනයන් කිරීමට කටයුතු කරන ලෙස 2010 සැප්තැම්බර් 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මණ්ඩලය වෙත නියෝග කළද, 2013 මැයි 12 දින වන විටත් අදාල සංශෝධනයන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් එක් එක් වියදම් කාණ්ඩය සඳහා පමණක් යොදා ගත යුතු බවට උපදෙස් ලබාදී තිබුණද මණ්ඩලය විසින් පුනරාවර්තන වියදම් සඳහා ලබාදී තිබූ රු.37,240,000 ක් වූ මුදලින රු.1,232,662 ක් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි. නමුත් ප්‍රාග්ධන වියදම් සඳහා සලසා තිබුණු රු.169,000 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.30,664 ක් පමණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

1999 වර්ෂයේ සිට 2011 දක්වා මණ්ඩලය වෙත ලැබී තිබුණු සියළු මුල්‍ය ප්‍රකාශන මාස 6 ක කාල සීමාවක් තුල ස්කෑන් කර නිම කිරීම සඳහා මසකට රු.42,000 ක ගාස්තුවක් ගෙවීමට එකඟ වී බාහිර සමාගමක් හා ගිවිසුමකට එළඹ තිබුණද, ගිවිසුම්ගත කාල සීමාව තුළ අදාල කාර්ය නිම කිරීමට නොහැකි වූ බැවින් දෙවන වරට ගිවිසුමක් අත්සන් කළද, එම කාලයද ඉකුත් වී 2012 දෙසැම්බර් 31 දින වනවිට අදාල කාර්ය නිම කර තිබුණි.

මේ සඳහා 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.191,626 ක් සහ රු.388,188 ක් ඉහත සමාගම වෙත ගෙවා තිබුණි. මේ අනුව අපේක්ෂිත වියදමට වඩා රු.291,928 ක අතිරේක මුදලක් දැරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

## 3.4 දෘෂ්‍ය අක්‍රමිකතා

(අ) මණ්ඩලය විසින් ගෙවා තිබුණු දිරි දීමනා සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 ජනවාරි 17 දිනැති අංක MF 2/4/SLAASMB/GEN දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවා තිබුණු ලිපියේ (v) ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන අහඹු ක්‍රමයට ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රමය වෙනුවට සියළු පෞද්ගලික ආයතනවල ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රමයක ඇති කර ඒ අනුව දිරි දීමනා යෝජනා ක්‍රමයක් ඇති කරන ලෙස දක්වා තිබුණත්, ඊට පටහැනිව සහ 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගෙන සකස් කළ දිරි දීමනා ක්‍රමයක් උපයෝගී කරගෙන 2012 වර්ෂයේ මාස 6 ක කාලයක් සඳහා රු.1,950,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

(ii) දිරි දීමනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණ විය යුත්තේ සාමාන්‍ය රාජකාරි කටයුතුවලදී කරනු ලබන වැඩ ප්‍රමාණයට වඩා වැඩි කාර්ය භාරයක් ඉටු කර ගැනීම වුවත්, 2012 වර්ෂය තුළ සැළසුම් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන 302 ක් සමාලෝචනය කිරීම සහ විගණන ලිපිගොනු 50 ක් සමාලෝචනය කිරීම පමණක් සිදුකර තිබුණි. දිරි දීමනා ගෙවීම තුලින් ළඟාකරගත් ඉලක්ක පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) දිරි දීමනා ක්‍රමයක් සකස් කිරීමේදී නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් වන අයුරින් සහ ඔවුන් අභිප්‍රේරණය වන අයුරින් සිදු කළ යුතු වුවද, මණ්ඩලයේ දිරි දීමනා ක්‍රමය ඊට පටහැනිව සකස් කර ඇති බව පහත කරුණු අනුව තහවුරු විය.

- දිරි දීමනා ලෙස ස්ථාවර මුදලක් සෑම පුද්ගලයෙකු වෙතම ලබාදීම

- දිරි දීමනා ලබාදීම සම්බන්ධයෙන් පුද්ගල කාර්ය සාධන නිර්ණායක සකස් කර නොතිබීම

- දිරිදීමනා ලබාදීම සඳහා සම්පූර්ණ කළ යුතු ඉලක්ක හදුනා නොගැනීම

(ආ) නිල වාහනයක් හිමි මණ්ඩලයේ තාක්ෂණ නිලධාරිනියකට 2011 දෙසැම්බර් 07 සිට 2012 අප්‍රේල් 11 දක්වා ප්‍රසූත නිවාඩු ලබා සිටි කාල සීමාව සඳහා මසකට රු.12,500 බැගින් ඉන්ධන දීමනාව ලබාදී තිබුණි. එසේම කුලී පදනම මත මෝටර් රථයක් ලබාදී තිබූ තාක්ෂණ නිලධාරිනියක් 2012 ජූලි 30 සිට 2012 නොවැම්බර් 20 දක්වා ප්‍රසූත නිවාඩු ලබා සිටි කාලය සඳහා කුලී පදනම මත ලබාගත් මෝටර් රථය වෙනුවෙන් මසකට රු.44,800 බැගින් බදු කුලී සහ මසකට රු.12,500 බැගින් ඉන්ධන දීමනාව වශයෙන් එකතුව රු.210,100 ක්ද ගෙවා තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පූර්ණ වෘත්තීය සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරිවරුන් සම්බන්ධ තොරතුරු පද්ධතියක් පවතින අතර අවශ්‍ය ඕනෑම විටක එම තොරතුරු ලබා ගැනීමේ හැකියාව මණ්ඩලය සතුවේ. මේ නිසා සියලුම වරලත් ගණකාධිකාරිවරුන් සඳහා විද්‍යුත් තැපැල මගින් හෝ මුද්‍රිත පත්‍රිකා (Leaflet) මගින් තොරතුරු සංනිවේදනය කිරීමේ හැකියාව පවතී. ඒ අනුව මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට අදාල මුද්‍රිත පත්‍රිකා 2,500 ක් ශ ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ලියාපදිංචි වරලත් ගණකාධිකාරිවරුන් වෙත යවා තිබුණි. මීට අමතරව විද්‍යුත් තැපැල මගින්ද අදාල තොරතුරු සංනිවේදනය කළ හැකිව තිබියදී එසේ නොකර මණ්ඩලය විසින් ඉංග්‍රිසි පුවත්පත් 7 ක රු.1,669,555 ක් වැනි විශාල පිරිවැයක් දරා පුරප්පාඩු පිළිබඳ දැන්වීම් පලකර තිබුණු නමුත්, ත්‍රි භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ප්‍රධාන විධායක තනතුරු වන අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරු 2 ක සඳහා 2009 සැප්තැම්බර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ

අතර 2012 අගෝස්තු 31 දිනෙන් ඔවුන්ගේ කොන්ත්‍රාත් කාල සීමාව අවසන් වී තිබුණි. එදින සිට 2013 මැයි 12 දක්වා විධිමත් පත්වීමක් සිදු නොකර වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

"එම පත්වීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2012 අගෝස්තු මස 09 වන දින පැවති රැස්වීමේදී දීර්ඝ කර තිබූ බැවින් එය වලංගු බව අපගේ අදහසයි" යනුවෙන් මණ්ඩලයේ සභාපති විසින් මා වෙත දන්වා ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය හා අධීක්ෂණ පරිපාලනය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ඇති කර තිබුණද, එම තනතුර 1998 වසරේ සිට එනම් වසර 15 ක සට පුරප්පාඩුව පැවති අතර එය පිරවීම සඳහා මෙතෙක් කටයුතු කර නොතිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2011 අප්‍රේල් 21 දිනැති ලිපිය මගින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය අධීක්ෂණය කිරීමට සහ විගණන අධීක්ෂණය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දෙකක් අනුමත කර තිබුණද, එම තනතුරු පිරවීම සඳහාද 2013 මැයි 12 දක්වා කටයුතු කර නොතිබුණි. මණ්ඩලයේ මූලිකම කාර්ය ඉටු කර ගැනීමට සෘජුවම බලපාන තනතුරු පුරප්පාඩුව පැවතීම කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) නිලධාරීන් දිරි ගැන්වීම සඳහා ඉහළ කළමනාකාරීත්වයට අයත් තනතුරුවල ස්ථිර සේවයේ යෙදෙන්නන්ට වැටුපට අමතරව 25% ක විශේෂ දීමනාවක් සහ අතිරේක ප්‍රතිලාභ ලබාදෙන ලෙසත්, එසේ බඳවා ගැනීමට නොහැකි නම් එකඟ වූ වැටුපකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලෙසත් මුදල් අමාත්‍යාංශය උපදෙස් ලබා දී තිබුණි. එහෙත් 2013 මැයි 31 දක්වා අනුමත සේවක සංඛ්‍යාව වන තනතුරු 14 න් 5 ක් පුරප්පාඩු වී තිබුණි.

(ඇ) 2011 අප්‍රේල් 21 දිනැති අංක ඩීඑම්එස්/ඊ1/4/6/11 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ කාර්ය මණ්ඩලය අනුමත කිරීමේ ලිපියට අනුව සහකාර තාක්ෂණ කළමනාකරු තනතුරක් අනුමත කර තිබුණි. එසේ වුවද මණ්ඩලය විසින් එම තනතුර සඳහා 2013 වර්ෂයේදී නිලධාරීන් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඉ) මණ්ඩලයේ ස්ථිර සේවයේ යෙදී සිටින සහකාර මූල්‍ය හා පරිපාලන කළමනාකරු, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් පරිපාලක, ලේකම්, කළමනාකරණ සහකාර සහ කාර්යාල සහායක යන තනතුරු දරන නිලධාරීන්ට වැටුප් වර්ධක ලබාදීම ක්‍රමවත් ආකාරයට සිදු කර නොතිබුණි.

(ඊ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 88 ජේදය ප්‍රකාරව සියළුම රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් පෞද්ගලික ලිපිගොනු නඩත්තු කළ යුතු අතර, එහි අන්තර්ගත විය යුතු ලියවිලි පිළිබඳ විස්තර එම ගැසට් පත්‍රයේ 87 හා 88 වැනි ජේද වල දක්වා

තිබුණි. එහෙත් මණ්ඩලයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත්ව නොතිබුණි.

## 3.7 සේවක පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

2012 දෙසැම්බර් 31 වන විට සේවක පාර්තෝෂිත සඳහා රු.3,979,293 ක් මණ්ඩලය විසින් ප්‍රතිපාදනය කර තිබුණද ඒ සඳහා අරමුදලක් ගොඩනැගීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මෙහි පිටපතක් ඊලඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය ඉදිරිපත් කරන ලද්දේ මාස 3 ක ප්‍රමාදයකින් පසු එනම් 2013 මාර්තු 12 දිනදීය.

(ආ) ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ කාර්යයන් හඳුනා ගනිමින් හා අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් වාර්ෂිකව සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමෙන් ඉදිරි වර්ෂය සඳහා වඩා හොඳ සැලැසමක් පිළියෙල කර ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. එහෙත් මණ්ඩලය විසින් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්ම 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්තාවේම පිටපතක් බව අදාල වාර්තා සැසඳීමේදී අනාවරණය විය. සංයුක්ත සැලැස්ම සකස් කිරීම නිසි කළමනාකාරීත්වයකින් සහ මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි කර ගැනීමට හැකිවන ආකාරයට සිදු කර නොතිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 5.1.2 ඡේදයට ප්‍රකාර පහත තොරතුරු ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්මෙහි හෙළිදරව් කර නොතිබුණි.

(i) මණ්ඩලය සතු වර්තමාන සම්පත් යටතේ මානව සම්පත හා කළමනාකරණ දක්ෂතා පිළිබඳ තොරතුරු

(ii) අනුයාත වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල යටතේ 2011 වර්ෂයට අදාල තොරතුරු

### 4.2 ක්‍රියාකාර සැලැස්ම

(අ) මණ්ඩලය විසින් වර්ෂය තුල ඉටු කළ යුතු සියලුම කාර්යයන් ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර එම කාර්යයන් වර්ෂයේ කුමන කාල සීමාවන් තුල ඉටු කරන්නේද සහ ඒවා ඉටු කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරී ඇති නිලධාරීන් කවුරුන්ද යන්න පැහැදිලිව දැක්විය යුතුය. නමුත් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඒ අනුව සකස් කර නොතිබුණි. තවද සංයුක්ත සැලැස්මෙහි 2012 වර්ෂයට අදාලව සැලසුම් කළ කාර්යයන් (අංක 2 සිට 9 දක්වා) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. එය වර්ෂය පමණක් සංශෝධනය කර තිබූ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි පිටපතක් බව අදාල වාර්තා සැසඳීමේදී නිරීක්ෂණය විය.

(ආ) විගණන සමාගම් තම විගණන කටයුතු ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදු කර තිබේ දැයි පරීක්ෂා කිරීම මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යයක් වන අතර, 2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් ගණන 50 ක් වූ නමුත් සංයුක්ත සැලැස්මට අනුව එම ප්‍රමාණය 30 ක් වී තිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

(අ) ම.රෙ.134 (2) ප්‍රකාරව පුද්ගලික විගණන සමාගම විසින් අභ්‍යන්තර විගණන වැඩ සටහන් සකස් කර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) එසේම මු.රෙ.134 (3) ප්‍රකාරව 2012 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අදාල විගණන සමාගම විසන් 2012 මුල් අර්ධ වර්ෂයට අදාල කෙටුම්පත් වාර්තාව 2012 නොවැම්බර් 26 මණ්ඩලයේ කළමනාකාරත්වය වෙත ඉදිරිපත් කර තිබුණත් එම වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණයන් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරුණු පැහැදිලි කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂය අවසන් වී මාස 6 කට ආසන්න කාලයක් ගතවී තිබුණත් දෙවන අර්ධ වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු ආරම්භ කර නොතිබුණි.

### 4.4 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ජේදය ප්‍රකාරව විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක් වරක් පැවැත්විය යුතු වුවත්, 2012 වර්ෂයේ පළමුවන හා දෙවන කාර්තු සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. එසේම, තුන්වන හා හතර වන

කාර්තු රැස්වීම් අභ්‍යන්තර විගණකගේ මූලකත්වයෙන් පවත්වා නොතිබුණු අතර, නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට ආරාධනා කර නොතිබුණි.

## 4.5 අයවැය පාලනය

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒවා ඉදිරිපත් කරන ලද්දේ මාස 3 ක ප්‍රමාදයකින් පසු එනම් 2013 මාර්තු 12 දිනදීය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාර වාර්ෂික අයවැයෙහි ඇතුළත් විය යුතු තොරතුරු පිළිබඳව දක්වා ඇත. නමුත් විගණනය වෙත ඉදිරිපත් කරන ලද අයවැයෙහි පහත තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(i) වර්ෂය සඳහා අයවැය ගත ආදායම
(ii) වර්ෂය අවසානයට අයවැය ගත ශේෂ පත්‍රය
(iii) වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ඇ) අයවැයගත වියදම් සහ සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) කාර්ය මණ්ඩල පර්පාලනය
(ඈ) අයවැය පාලනය

(ඉ) සුළු මුදල් කළමනාකරණය